**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය- සංරචක 02 (පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) - 2023**

---

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය- සංරචක 02 ( පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2017 සැප්තැම්බර් 29 දිනැති 5788 - එල්කේ අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර ගිවිසුම්ගත ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය රාජ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සියලුම පළාත්වල පළාත් මාර්ග අධිකාරින් සංශෝධිත සංරචක 02 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වත්කම් කළමණාකරණ පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම හා පළාත් මාර්ග සඳහා ප්‍රවේශ හා කළමණාකරණ රාමුව වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,875 කට සමාන එජඩො මිලියන 125ක් වේ. ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, සංශෝධිත සංරචක 02 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 19,075කට සමාන එජඩො මිලියන 109ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මැයි 02 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. ව්‍යාපෘති කාලය 2024 මාර්තු 31 දක්වා දීර්ඝ කරන ලදි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති අංක 1/2019 දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් සෑම මාස 02කට වරක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ පවත්වා ඇත්තේ රැස්වීම් 03ක් පමණි. | අදහස් දක්වා නොමැත | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු විධිමත්ව පැවැත්විය යුතුයි. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 මතභේදාත්මක ස්වභාවයේ කරුණු**

| | **විගණන ගැටලු** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පැකේජ 03කට අදාළව වටිනාකම රු. මිලියන 43.2 ක ඉටුනොකර පැවති ඇස්තමේන්තු කළ වැඩ අයිතම 121 ක් ද, ඇස්තමේන්තු කළ වැඩ අයිතම 108කට අදාළව ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් ඉටුකළ වැඩවල වටිනාකම රු.මිලියන 129.96ක් ද, පැකේජ 04ක වැඩ අයිතම 117කට අදාළව ඇස්තමේන්තු කරන ලද ප්‍රමාණයන් ඉක්මවා ඉටුකළ වැඩ වටිනාකම රු.මිලියන 218.4ක් ද, පැකේජ 03 ක කලින් ඇස්තමේන්තු නොකළ ඉවුරු බැම් ඉදිකිරීමේ වැඩ අයිතම සඳහා රු.මිලියන 53.4ක් ද වශයෙන් විය. ඒ අනුව මෙහිදී උපදේශකවරුන්ගේ රාජකාරි නිසි සැළකිල්ලෙන් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භයේදී දළ ඇස්තමේන්තුවක් (සැලසුම් රහිතව) සකස් කර ටෙන්ඩර් කැඳවීමට භාවිතා කරයි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු නිසි අගයන් හඳුනාගෙන ඇස්තමේන්තු සංශෝධනය කෙරේ. මාර්ග ඇස්තමේන්තුව මුලින්ම සැලසුම් කර අවශ්‍ය අවශ්‍යතා හඳුනා ගැනීමෙන් සිදු කරන්නේ නම් මෙම වෙනස්කම් ඉතා අවම මට්ටමක තබා ගත හැකිය. කෙසේ වෙතත් ඒ සඳහා පළාත් මාර්ග අධිකාරියේ/ දෙපාර්තමේන්තුවල නිසි නිලධාරීන් නොමැති බැවින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුගේ සහ ඉංජිනේරුවරයාගේ නිලධාරීන් පිරිසක් මෙම සැලසුම් සහ ඇස්තමේන්තු ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්නා අතර සුදුසු ඇස්තමේන්තු එම අවස්ථාවේ දී සකස් කර ඇත.<br><br>ඒබීසී ඇතිරීම ආරම්භයේදී ඇස්තමේන්තු නොකළ නමුත් මාර්ගයේ වැඩ ආරම්භ කිරීමෙන් පසු (ඇස්තමේන්තුවෙන් වසර කිහිපයකට පසු) මාර්ග මතුපිට ඉතා දුර්වල බව හඳුනා ගන්නා ලදී. එබැවින් මුළු මාර්ගයම ඒබීසී වලින් ආවරණය කළ යුතු අතර ඒ අනුව පාරවල් සහ බැම්ම ඉදිකිරීම සිදු කිරීමට සිදු විය. එබැවින් ගෙවීම් ප්‍රමාණයේ වැඩි වීමක් සිදු විය. | විචලතාවයන් හේතුවෙන් රජයට එල්ල වන අධික බර අඩු කර ගැනීම සඳහා ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ආ) | ප්‍රමාණ පත්‍රයෙහි එක් එක් අයිතමය සඳහා ඉදිරිපත් කරන ලද ඒකකයක මිලට ප්‍රවාහන පිරිවැය ද ඇතුළත් විය යුතු වුවද, එන්.ඩබ්.පී. 03 පැකේජයේ ප්‍රවාහන පිරිවැය ලෙස කොන්ත්‍රාත්කරුට රුපියල් මිලියන 11ක් ගෙවා එය මිල විචලනය සඳහා ද යොදා ගෙන තිබුණි. | ආරම්භයේදී මෙම මාර්ග දෙකෙහිම සම්පූර්ණ ඒබීසී යෙදීමට තීරණය නොකළ අතර පසුව කොන්ත්‍රාත්තුව ලබා දීමෙන් පසුව මාර්ග මතුපිට දුර්වලතා හේතුවෙන් සම්පූර්ණ ඒබීසී යොදමින් මාර්ගය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ද්‍රව්‍ය ප්‍රමාණය වෙනස් වී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුවල ප්‍රමාණය සහ මිල වෙනස්වීම් හේතුවෙන්, එන්.ඩබ්.පී. 02, එන්.ඩබ්.පී 03 සහ ඩබ්.පී 01 යන කොන්ත්‍රාත් පැකේජ 03 ට අදාළව සියයට 10ක්වූ අවිනිශ්චිත ප්‍රතිපාදන සීමාවද ඉක්මවා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 13.7, 14.8 සහ 15.5 ලෙස විචලතා නියෝග නිකුත් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 පරිදි ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10ක්වූ අවිනිශ්චිත ප්‍රතිපාදන සීමාව ඉක්මවා සියයට 15ක සීමාව දක්වා විචලතා නියෝග නිකුත් කළ හැක්කේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් විචලතාවය පැහැදිලි කරන සියළුම ලිපිලේඛන ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කොට, ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ඒ පිලිබඳ සෑහීමට පත් නොවන්නේ නම් තාක්ෂණික කමිටු හා ප්‍රසම්පාදන කමිටු නිර්දේශ මත ප්‍රධාන ගණන්දිමේ නිළධාරියාගේ අනුමැතිය ඇතිවයි. එසේ වුවද ඊට පටහැනිව විචලතා නියෝග නිකුත් කිරීමෙන් පසුව ප්‍රසම්පාදන කමිටු නිර්දේශ හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අනුමැතිය ලබාදී තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. මාර්ග සංවර්ධනයේදී නිතර නිතර වෙනස්කම් සිදු වන අතර ආර්ථික අවපාතයන් හේතුවෙන් පසුගිය කාලයේ මිල ගණන් විශාල ලෙස ඉහළ යෑම් අනපේක්ෂිත තත්ත්වයන් ඇති වූ අතර මේ හේතුවෙන් මෙම වැඩිවීම් සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවරයාගෙන් අනුමැතිය ලබා ගැනීම ප්‍රායෝගිකව අපහසු වේ. එබැවින් එම වැඩි කිරීම් එකට ගොනුකර එකවර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එය අනුගමනය කරන ක්‍රමයයි. | විචලතාවයන් හේතුවෙන් රජයට එල්ල වන අධික බර අඩු කර ගැනීම සඳහා ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 3.2 පද්ධති හා පාලන

| විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් සිදු කර නොතිබුණි. | මේ වන විට අභ්‍යන්තර විගණනය සිදු කෙරේ. | අභ්‍යන්තර විගණනය නිසි ලෙස ක්‍රියාත්මක විය යුතුය. |